# INSTITUTE OF PHYSICS, SRI LANKA

Vidya Mandiraya, 120/10, Wijerama Mawatha, Colombo 7, Sri Lanka.

(*Incorporated by an Act of Parliament, Act No. 12 of 1986*)

*Web:* *http://www.ipsl.lk*


## තෙවන ශ්‍රී ලංකා න්‍යෂ්ටික විද්‍යා ඔලිම්පියාඩ් තරගය (SLNSO) - 2026

## පාසල් සිසුන් සඳහා අයදුම්පත් කැඳවීම

ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනය (IPSL) විසින් සංවිධානය කරනු ලබන 3 වන ශ්‍රී ලංකා න්‍යෂ්ටික විද්‍යා ඔලිම්පියාඩ් (SLNSO) තරඟය සඳහා අයදුම්පත් භාරගන්නා අතර එය රජයේ සහ රාජ්‍ය නොවන පාසල්වල සිසුන් සඳහා විවෘත වේ. තරගය 2026 ජනවාරි මස 11 දින සිංහල/ඉංග්‍රීසි/දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2025.12.28 වේ.

**විභාග මධ්‍යස්ථාන**

සිසුන්ට කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, කැලණිය විශ්වවිද්‍යාලය, වයඹ විශ්වවිද්‍යාලය-කුලියාපිටිය, රජරට විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය, විවෘත විශ්වවිද්‍යාල ප්‍රාදේශීය මධ්‍යස්ථානය- මහනුවර ,මඩකලපුව, රුහුණු, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, වවුනියාව විශ්වවිද්‍යාලය-පොම්පෙයිමඩු යන ආයතනවල දී ඔලිම්පියාඩ් විභාගයට සහභාගි විය හැකිය. යම් මධ්‍යස්ථානයක් සඳහා ලියාපදිංචි වන සිසුන් සංඛ්‍යාව ඉතා අඩු නම්, ඔවුන් ළඟම ඇති විභාග මධ්‍යස්ථානයට අනුයුක්ත කෙරේ.

**සුදුසුකම් සහ විභාග ආකෘතිය**

පාසල් අධ්‍යාපනය ලබන 2026 ජනවාරි 1 වන දිනට වයස අවුරුදු 20 ට අඩු සිසුන්ට මෙම තරගය සඳහා ඉල්ලුම් කළ හැකිය. විභාග ප්‍රශ්න පත්‍රයේ කාලය පැය දෙකක් වන අතර ප්‍රධාන වශයෙන් උසස් පෙළ භෞතික විද්‍යා විෂය නිර්දේශය මත පදනම් වූ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. ප්‍රශ්නවලින් 25% ක් පදාර්ථ සහ විකිරණ යන කොටස ආවරණය වන පරිදි ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ.

**සම්මාන සහ ජාත්‍යන්තර නියෝජනය**

IPSL විසින් සංවිධානය කරනු ලබන වාර්ෂික ත්‍යාග ප්‍රධානෝත්සවයේ දී ජාතික මට්ටමේ ජයග්‍රාහකයන්ට රන්, රිදී, ලෝකඩ පදක්කම් සහ කුසලතා සහතික පිරිනැමේ. මෙම විභාගයේදී ඉහළම දස්කම් දක්වන සිසුන්ට ජාත්‍යන්තර න්‍යෂ්ටික විද්‍යා ඔලිම්පියාඩ් (INSO) තරගය නියෝජනය කිරීම සඳහා පැවැත්වෙන තේරීම් විභාගයට මුහුණ දීමට අවස්ථාව සැලසේ. තෝරාගත් හොඳම තරගකරුවන් 04 දෙනෙකුට IPSL හි මගපෙන්වීම ඇතිව 2026 සැප්තැම්බර් මාසයේදී පැවැත්වීමට නියමිත ජාත්‍යන්තර න්‍යෂ්ටික විද්‍යා ඔලිම්පියාඩ් (INSO) තරගය නියෝජනය කළ හැකිය. (සටහන: ජාත්‍යන්තර තරගය, නියෝජනය කරන සිසුන්ගේ වයස, 2026.08.31 දිනට අවුරුදු 20 ට නොවැඩි විය යුතුය).

INSO තරඟය යනු වයස අවුරුදු 20 ට අඩු ද්විතීයික පාසල් සිසුන් සඳහා වාර්ෂිකව පවත්වනු ලබන ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ (IAEA) තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතියේ "ද්විතීයික හා තෘතීයික මට්ටමින් න්‍යෂ්ටික විද්‍යා හා තාක්ෂණ අධ්‍යාපනයට සහාය වීම" රාමුව යටතේ සංවිධානය කරනු ලබන වාර්ෂික ජාත්‍යන්තර තරඟයකි. 2025 වසරේ මැලේසියාවේදී පවත්වනු ලැබූ දෙවන INSO තරඟාවලියට ශ්‍රී ලංකාවෙන් සිසුන් සිව් දෙනෙකු සහභාගී වී රිදී පදක්කම් දෙකක් සහ ලෝකඩ පදක්කම් දෙකක් දිනා ගත්හ. ශ්‍රී ලංකා කණ්ඩායම සඳහා IAEA විසින් පූර්ණ අනුග්‍රහය දක්වන ලදී.

අයදුම් කරන ආකාරය

ඉහත ජාතික ඔලිම්පියාඩ් තරගාවලියට සහභාගීවීමට කැමති සිසුන්ට www.ipsl.lk වෙබ් අඩවියෙන් අන්තර්ජාලය හරහා අයදුම්පත් සහ අනුහුරු ප්‍රශ්න පත්‍ර ලබා ගත හැක. විභාග අංකය සහිත ප්‍රවේශ පත්‍රය මාර්ගගත අයදුම්පත්‍රයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනයට යවනු ලැබේ. විභාග අංකය සහිත ප්‍රවේශ පත්‍රය විභාගය පැවැත්වීමට නියමිත දිනට සතියකට පෙර නොලැබුනේ නම්, කරුණාකර ඒ පිළිබඳව ශ්‍රී ලංකා න්‍යෂ්ටික විද්‍යා ඔලිම්පියාඩ් කාර්යාලයේ විද්‍යුත් තැපැල (slnso.ipsl@gmail.com) මාර්ගයෙන් විමසන්න.

**වැඩිදුර විමසීම්**

ඩි විස්තර සඳහා කරුණාකර ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනය (https://ipsl.lk/nuclear-science-olympiad/) වෙබ් අඩවියට පිවිසෙන්න. මේ පිළිබඳව වැඩි විස්තර සඳහා ප.ව.12.00 -1.00 හෝ ප.ව. 9.00 - 10.00 අතර පමණක්, 0776972577 දුරකථන අංකය ඔස්සේ මහාචාර්ය ශාන්ත ගමගේ මහතා අමතන්න.


**මහාචාර්ය එන්.ජී.එස්.ශාන්ත ගමගේ**

**ජාතික සම්බන්ධීකාරක** /SLNSO,

භෞතික විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ.

https://www.facebook.com/SLNuclearScienceOlympiad/